පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සතිය- 13 වන සතිය

විෂය:- පෙරදිග සංගීතය.

ශ්‍රේණිය :- 11

Prepared by-කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

Department of Education,Sabaragamuwa Province/ Weekly School

## නාඩගම් හා නූර්ති ගීත අතර සංගීතයේ වෙනස

නාඩගම් හා නූර්ති ලංකාවේ ඉතා ජනප්‍රිය කලා අංග ය. මේ නාටක දෙවර්ගයට ම සංගීතය මූලික වූ නිසා ගීත විශාල ප්‍රමාණයක් අඩංගු විය. සෑම නාට්‍යයක ම එක් ගීතයක් හෝ රසිකයන් අතර ජනප්‍රිය වූ නිසා විවිධ තනු යොදා නව ගීත නිර්මාණය කිරීම නිෂ්පාදකවරුන්ට මහත් අභියෝගයක් විය. මේ නිසා අවශ්‍ය සම්පත් පුද්ගලයන් ඉන්දියාවෙන් ගෙන්වා ගැනීම සිදු විය. නාඩගම් හා නූර්ති නාට්‍යයන්හි සංගීතයේ වෙනස්කම්වලට බලපෑ ප්‍රධානතම වෙනස්කම වූයේ සංගීත සම්ප්‍රදායයේ වෙනස යි.

ලංකාවේ මුලින් ම රඟ දක්වුණේ නාඩගම් නාට්‍යය යි. නාඩගම් සඳහා අලගනායිදු නම් දකුණු ඉන්දීය සංගීතඥයකුගේ සහය ලබා ගත් බව පොතපතේ සඳහන් වෙයි. ප්‍රථම නාඩගම හරිස්චන්ද්‍ර නම් විය. පිලිප්පුසිංඤෝ ගේ ඇහැළේපොල නාඩගම වැනි මුල් නාඩගම්වල ගී තනු හා සංගීතය අලගනායිදු විසින් නිම කරන්නට ඇතැයි පැහැදිලි වේ. අලගනායිදු දකුණු ඉන්දීය සංගීතඥයකු නිසා නාඩගම් සඳහා භාවිත කර ඇත්තේ කර්ණාටක සංගීතය යි. කර්ණාටක සංගීතයේ යෙදෙන මේලයන්හි ස්වර මේ සඳහා භාවිත කරන්නට ඇතැයි පසක් කර ගත හැකි ය.

- සංබරාභරණ, මේචකල්‍යාණි, කරහරප්‍රිය වැනි මේල භාවිතය,
- කර්ණාටක මෘදංගය ආශ්‍රිත ව ගොඩනැඟුණු මද්දලය භාවිතය,
- සප්තක තුනක් ආශ්‍රයයෙන් ගොඩ නැඟී ඇති ගී තනු,
- ඉන්නිසය, තෝඩායම, තර්ගය, තානම, අගහාරන්,

පොතේ සින්දුව, වැනි නාඩගමට පමණක් සීමා වූ සුවිශේෂී ගායන කොටස් නාඩගමේ සංගීතයට අත්‍යවශ්‍ය විය. ලංකාවේ නාට්‍ය කලාවට එක් වූ නාඩගම් හා නූර්ති නාට්‍ය සම්ප්‍රදාය දෙකකට අයත් වන බව පැහැදිලි ය. නාඩගම් නාට්‍ය කලාවේ එන ගීත හා නූර්ති ගීත අතර බෙහෙවින් වෙනස්කම් දක්නට ලැබේ.

මේ ගීත වර්ග දෙක සඳහා යොදාගෙන ඇති සංගීතය මෙම වෙනස්කමේ ප්‍රධාන අංගය යි. දකුණු ඉන්දියානු කර්ණාටක සංගීතය නාඩගම් ගීතවලට බලපා ඇති අතර නූර්ති ගීත සඳහා උතුරු ඉන්දියානු හින්දුස්ථානී සංගීතය මූලික වී තිබේ. නාඩගම් සඳහා යොදා ගන්නා මද්දලය ලංකාවට පමණක් ආවේණික වූවකි. ඊට දෙමළ බෙරය කියා ද ව්‍යවහාර කළ බවත් පොත්පත්හි සඳහන් වේ. එම නාමය අනුව මෙම භාණ්ඩය කර්ණාටක සංගීතයේ යොදා ගත්තක් බව පැහැදිලි ය. නූර්ති නාට්‍යයන්හි තාල වාද්‍ය සඳහා යොදා ගෙන ඇත්තේ හින්දුස්ථානී සංගීතයේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය වන තබ්ලාව යි. මද්දලය නිසා නාඩගම්වලට එම බෙර පද, ගමන් පද, තානම් ආදිය මිශ්‍ර වී ඇත. නූර්ති නාට්‍ය සඳහා තබ්ලාවෙන් එවැනි බලපෑමක් ඇති වී නැත. දෙබස් ගායනය නාඩගමේ ඇති විශේෂ ලක්‍ෂණයකි. එහෙත් නූර්තිවල දෙබස් ගායනයක් නැත. දකුණු ඉන්දියානු තෙරුක්කූත්තු නම් වීදි නාට්‍ය විශේෂය නාඩගම් සඳහා බලපා ඇති අතර ඉන්දියාවේ බලිවාලා නාට්‍ය සමාගමේ නෘත්‍ය සම්ප්‍රදායය නූර්ති සඳහා යම් බලපෑමක් කර ඇත.

මේ නාට්‍ය යුගලයේ ගීත ආකෘති අතර ද වෙනස්කම් වේ. නූර්තිවල ගීත ආකෘතිය වන්නේ හින්දුස්ථානී සංගීතයේ ඛ්‍යාල් ගායනාවල ආකෘතිය යි. එනම් ස්ථායි හා අන්තරා ආකෘතිය යි. එහෙත් නාඩගම්වල එවැනි ආකෘතියක් දක්නට නොලැබේ. නාඩගම් ගීතවල සුවිශේෂ අංග කිහිපයක් ඇත. උරුට්ටුව, තෝඩායම, ඉන්නිසය, තර්ගය ඉන් කිහිපයක් පමණි. උරුට්ටුව යනු දමිළ බසින් ආභරණය, අලංකාරය යන අරුතක් ගෙන දෙන්නකි. උරුට්ටුව නාඩගමට පමණක් ආවේණික වූවකි. නාඩගමට උරුට්ටුව මෙන් නූර්තියට දොහොරාව නම් අංගයක් තිබේ. ගීතයක ගැයෙන පද කොටස් තාලයෙන් තොර ව අනාඝාතාත්මක ව ගැයීම දොහොරාවේ එන විශේෂ ලක්‍ෂණයකි.

උරුට්ටුව:-

+ නිම ල / මෝ ක්‍ෂ ප්‍ර / කා s ශ / ත්‍රෛ ලෝ ක්‍ය /

සතුරු මාsර / සෙනග වකිපි / දහස් ගණන් / හෙනහ ඬගුගු /

1. නූර්ති ශ්‍රී ලංකාවේ ජනප්‍රිය කලා අංගයක් වීමට බලපෑ හේතු මොනවාද? කෙටියෙන් විමසන්න.

2. නූර්ති සඳහා භාවිතවන සංගීත භාණ්ඩ පිළිබඳ හැඳින්වීමක් කරන්න.

3. නූර්ති ගීත වල ඇතුළත් විශේෂ ලක්‍ෂණ උදාහරණ සහිතව විස්තර කරන්න.

4. ඔබ උගත් නූර්ති ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

5. එම ගීතය ගායනයට හා වාදනයට හුරුවන්න.